# වතුර බිංදු යහළුවෝ



සයුනි බෙනාරා සේනාරත්න

**කථාව හා චිත්‍ර -**

සයුනි බෙනාරා සේනාරත්න

ISBN : 978 - 624 - 206 - 809 - 1

2023 දෙසැම්බර් මස **06** වන දින.

**කතෘගේ වෙනත් පොත් -**

කැලේ යාළුවෝ - ප්‍රථම මුද්‍රණය 2021

ISBN : 978 - 624 - 206 - 308 – 9

# පිදුම

මාව ආදරයෙන්
රැකබලා ගන්නා
*අම්මේ තාත්තේ,*
කවා පොවා ආදරයෙන් නහවා,
මාගේ මුහුණට
එළිය දෙන ඔබලාට,
මම මේ පොත
ආදරයෙන්
පුදනු ලබමි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමින් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි.එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරවීම ලැබීම පාසල වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්’’ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවෙන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශය අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යැයි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරන මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්,ආදි ශිෂ්‍යයන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.....

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය- මහනුවර

2023.11.01

# පටුන

1)වතුර බිංදු යහළුවෝ හමුවීම

2)අළුත් යහළුවෙක්

3)නව නිපැයුම

4)ඊර්ෂ්‍යාවට පාඩමක්



# වතුර බිංදු යහළුවෝ හමුවීම

එක ගෙදරක කරුණාවන්ත හොඳ ළමයෙක් ජීවත්වුණා.

දවසක් ඒ ළමයාට වතුර තිබහක් ආපු වෙලාවක එයා ජල කරාමය විවෘතකර ජලය පානය කළා.

එවිට වතුර බිංදු කිහිපයක් පොළොවට වැටුණා.

"ඕ,ඒවාට පණ ඇවිල්ලා"ළමයා බියෙන් කෑ ගැසුවා.



“බයවෙන්න එපා අපි ඔයාව ලස්සන තැනකට එක්කන් යන්නයි ආවෙ.”

“අපි යාළුවෝ වෙමු. හැබැයි කාටවත් කියන්න එපා මේක රහසක්”

ඔවුන් කිව්වා. “හරි මම එහෙම කරන්නම්”ළමයා කිව්වා.



මේ යාළුවෝ ටික ළමයාව ලස්සන තැනකට එක්කන් ගිහින් ජලයෙන් මිනිසුන්ට ඇති ප්‍රයෝජන කියා දුන්නා



“මම ඒකට හරි කැමතියි” ළමයා කිව්වා

# අලුත් යහළුවෙක්

මොවුන් ඇවිදිමින් සිටියදී තවත් වතුර බිංදු සමග සිටින ළමයෙක් දුටුවා.

ඒ ළමයාට ජලය අවශ්‍ය වී ළමයා වතුර ඉල්ලන විට නරක වතුර බිංදු ඔහුට ජලය නොදී සිටියා.

නමුත් ඒ දැක හොඳ වතුර බිංදු යාළුවෝ ඇයට ජලයදී ඔහුවත් ඔවුන්ගේ යාළුවෙක් කර ගත්තා.



# නව නිපැයුමක්

“අපි දැන් හැමදෙනා ම එකතුවෙලා මොකක් හරි රටට වැදගත් නිර්මාණයක් කරමු” ළමයා කිව්වා.

“ඒක නම් හොඳ අදහසක්” වතුර බිංදු යාළුවෝ එකඟවුණා.

“මට අදහසක් ආවා, අපි විශාල ස්වයංක්‍රීය ජල කරාමයක් හා කුඩා ස්වයංක්‍රීය ජල කරාම නිර්මාණය කරමු” අනෙක් ළමයා කිවුවා.



“ඒක නම් හොඳ ම හොඳ අදහසක්,එතකොට අපේ රටේ ස්පර්ශයෙන් බෝවන ලෙඩ රෝග ගොඩාරියක් අඩුවෙයි”වතුර බිංදු යාළුවෝ කීවා.

ඔවුහු අතිදැවැන්ත ස්වයංක්‍රීය ජල කරාමයක් හා ඒවගේ ම කුඩා ජල කරාම නිර්මාණය කළෝ ය.

ඔවුන් ඉතා ප්‍රසිද්ධවුණා.

ස්පර්ශය- ඇල්ලීම


# ඊර්ෂ්‍යාවට පාඩමක්

නරක වතුර බිංදු යාළුවන්ට හරිම ඉරිසියයි.

එයාලා හොරෙන් හොරෙන් ගිහින් විශාල ස්වයංක්‍රීය ජල කරාමයෙන් වතුර එන්නේ නැතිවෙන්න එයට ප්ලාස්ටික් කැබැල්ලක් සවිකරන්න යනවිට හොඳ වතුර බිංදු යාළුවන්ට ඒක ආරංචිවෙලා හනිකට ආවා.

එයාලා ජල කරාමය බාගෙට ඇරපු නිසා එයාලා හේදිලා ගියා.

හොඳ වැඩක් කරන්නම් කියලා හිතාගෙන අනෙක් නරක වතුර බිංදුවලට කතා කරලා ගංවතුරක් නිර්මාණය කළා.



මිනිස්සු ගහගෙන ගියා.

හොඳ වතුර බිංදු යාළුවෝ හනිකට බැම්මක් හදලා ඒකේ හිල් වද්දා.

මිනිස්සු නම් බේරුණා. නමුත් නරක වතුර බිංදු ගහගෙන ගහගෙන ගියා.

අනේ! අර වතුර බිංදුවල ඉරිසියාව නිසා ජීවිතයත් අහිමිවුණා.

# නිමි

## ආදර්ශය

1)අන් අයට ඊර්ෂ්‍යා කිරීමෙන් වළකින්න.

2)එකමුතු ව වැඩ කරන්න.

# පසුවදන

නුතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුලින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වර්ෂයේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුන්චි ගත් කතුවරියන්ය.පාසල තුල ගොඩනැගි ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගා වීමට නුතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.ඒ තුලින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුනුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟිම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි.මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම් කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි.පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිරිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමයා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජන ගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයකු වීමට ශක්තිය ලැබේවායි පතමු.....


මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කල ව්‍යාපෘතියෙහි නිර්මාපක


**2023.11.01**




ISBN: 978-6-24206-809-1